# පරිසර අමාත්‍යාංශය

## භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

# ඇබෑර්තු

1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත මගින් පිහිටුවන ලද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පවතින පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. භූ භෞතික විද්‍යාඥ 02**

**02. ලේඛකාධිකාරී 01**

**03. සහකාර අධ්‍යක්ෂ ප්‍රසම්පාදන 01**

**04. විදුම් නිලධාරී 01**

### 01. භූ භෞතික විද්‍යාඥ - (MM 1-1)

**බාහිර අයදුම්කරුවන් -**

**අධ්‍යාපනික**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක භෞතික විද්‍යාව විශයක් වශයෙන් ඇති භූ විද්‍යාව පිළිබඳ විශේෂ – විද්‍යාවේදී උපාධිය (පළමු පෙළ හෝ දෙවන පෙළ)

සහ

**සේවා පළපුරුද්ද**

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ (භූ භෞතික විද්‍යාව) අවම වශයෙන් වසර එක (01) සේවා පළපුරුද්දක් සපුරා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

**අධ්‍යාපනික**

1. ඉහත සඳහන් කොට ඇති පරිදි බාහිර අයදුම්කරුවන් හට තිබිය යුතු සුදුසුකම් සපුරාලීම

**සේවා පළපුරුද්ද**

2. අදාළ ක්ෂේත්‍රයේ (භූ භෞතික විද්‍යාව) කනිෂ්ඨ කළමනාකරු මට්ටමේ තනතුරක (JM 1-1) අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

### 02. ලේඛකාධිකාරී (MM 1-1)

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපනික**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක භූගෝල විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය (පළමු පෙළ හෝ දෙවන පෙළ),

සහ

**සේවා පළපුරුද්ද**

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ (ඛනිජ හිමිකම්/ භූ ගෝලීය තොරතුරු පද්ධතිය (GIS) හා දුරස්ථ සංවේදනය/ සිතියම් ශිල්පීය) පිළිබඳ අවම වශයෙන් වසර එකක (01) සේවා පළපුරුද්දක් සපුරා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2 )**

**අධ්‍යාපනික**

1. ඉහත සඳහන් කොට ඇති පරිදි බාහිර අයදුම්කරුවන් හට තිබිය යුතු සුදුසුකම් සපුරාලීම.

**සේවා පළපුරුද්ද**

2. අදාළ ක්ෂේත්‍රයේ (ඛනිජ හිමිකම්) කනිෂ්ඨ කළමනාකරු මට්ටමේ තනතුරක (JM 1-1) අවම වශයෙන් වසර 05 සතුටුදායක සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

### 03. සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) (MM 1-1)

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපනික සුදුසුකම්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක කළමනාකරණ / ආර්ථික විද්‍යාව / අලෙවිකරණය පිළිබඳ හෝ ප්‍රසම්පාදනයට අදාළ වෙනත් ඕනෑම උපාධියක් ලබා තිබීම.

සහ

**සේවා පළපුරුද්ද**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ප්‍රසම්පාදන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01 ක සේවා පළපුරුද්දක් සපුරා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

**අධ්‍යාපනික**

1. ඉහත සඳහන් කොට ඇති පරිදි බාහිර අයදුම්කරුවන් හට තිබිය යුතු සුදුසුකම් සපුරාලීම

2. සේවා පළපුරුද්ද

තනතුරට අදාළ ප්‍රසම්පාදන ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු මට්ටමේ තනතුරක (JM 1-1) අවම වශයෙන් වසර 05 සතුටුදායක සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

වයස් සීමාව (01,02 සහ 03 සඳහා) වයස අවුරුදු 22 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 පරිදි වන වැටුප් පරිමාණය

MM 1-1 රු. 53,175-10X1375-15X1910 = 95,575

### 04.විදුම් නිලධාරී (JM 1-1)

**බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2 හෝ 3 )**

**වෘත්තීමය සුදුසුකම්**

1. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික ක්ෂේත්‍රයේ අදාළ තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයක් මගින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික ශ්‍රේණියේ අදාළ කාර්මික / වෘත්තීය අභ්‍යාස ආයතනයක් මගින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 ට නොඅඩු යාන්ත්‍රික ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සංස්ථාවක/ මණ්ඩලයක/ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්දක් සපුරා තිබීම.

3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික ක්ෂේත්‍රයේ අදාළ තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයක් මගින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 ට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

සහ

සංස්ථාවක / මණ්ඩලයක / පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දහයක (10) සේවා පළපුරුද්දක් සපුරා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් කොට ඇති පරිදි බාහිර අයදුම්කරුවන් හට තිබිය යුතු සුදුසුකම් සපුරාලීම (1 හෝ 2 හෝ 3)

**සේවා පළපුරුද්ද**

තනතුරට අදාළ තාක්ෂණික ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර (MA 2-2) ශ්‍රේණිය II තනතුරෙහි අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා පළපුරුද්දක් සපුරා තිබීම.

**වයස් සීමාව (03 සහ 04)**

වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 පරිදි වැටුප් පරිමාණය JM 1-1 රු. 42,600 -10X755 - 18X1135=70580

### තනතුරට අදාළ වන පොදු කොන්දේසි

* තෝරාගනු ලැබූ අයදුම්කරු සේවක අර්ථසාධක අරමුදල වෙත ඔහුගේ වැටුපෙන් 10% ක දායකත්වයක් ලබාදිය යුතුය. කාර්යාංශය විසින් සේවක අර්ථසාධක අරමුදල සඳහා 15% ක දායකත්වයක්ද එයට අමතරව සේවක භාරකාර අරමුදල සඳහා 3% ක දායකත්වයක්ද ලබා දෙනු ලැබේ.
* රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය.
* රෝහල් වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රම පිළිබඳ හිමිකම් ඇත.
* බාහිර රෝගී වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම සඳහා හිමිකම් ඇත.
* අයදුම්කරු පිළිබඳව තොරතුරු ලබාගත හැකි ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක අයදුම්පතේ සඳහන් කළ යුතුය.
* අධ්‍යාපනික හා අනෙකුත් අදාළ සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය.

අයදුම්පත බහා එවනු ලබන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කර 2022.06.09 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල මගින් එවිය යුතුය.

කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය,**
**අංක 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ.**